47155

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

## 10 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 01යි.

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

* අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අදහසට වඩාත් සමීප අදහස ඇති පිළිතුර තෝරන්න.

(01) පසුගිය දිනවල මා ජීවත්වුණේ **වැලේ වැල් නැතිව**'යි සිරිදාස තම හිතවතුන්ට පැවසුවේ ය.

(1) කිසිවෙකුගේ උපකාරයක් නොමැති ව (2) මහත් ආර්ථික දුෂ්කරතා මැද
(3) බොහෝ සෙයින් රෝගාතුර ව (4) කිසිවක් බැරෑරුම් ලෙස නොගෙන

(02) සිදු වූ සියල්ල **ඉස්පිල්ලක් පාපිල්ලක් නැර** පවසන ලෙසට ඔහුට අණ ලැබිණි.

(1) අදාළ කිසි ම තොරතුරක් අත් නොහැර (2) ඇත්ත වසන් නොකර
(3) බොරුවෙන් මුලා කර (4) කිසි ම වග විභාගයකින් තොර ව

(03) ව්‍යාපාර දියුණු කර ගැනීමට තමා දැරූ සියලු ප්‍රයත්නයන් **වතුරේ ගිය** බව සිතීම පවා ඔහුට මහත් ශෝකයක් විය.

(1) ගංවතුරට හසු වූ (2) තද වැස්සකට හසු වූ (3) නොපෙනී ගිය (4) අපතේ ගිය

* අංක 04 ,05 ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත වාක්‍යවලට ගැළපෙන ඉඟිවැකි තෝරන්න.

(04) තමා සතු බලය **අයුතු ලෙස යොදා ගැනීම** හේතුවෙන් ඉහළ නිලධාරියාට විවිධ කරදරවලට මුහුණ දීමට සිදු විය.

(1) දඩමීමා කර ගැනීම. (2) අත් පා බැඳ තැබීම. (3) පැදුරටත් නොකියා යාම. (4) ගොනාට ඇන්දවීම.

(05) මැණියෝ තමා **සන්තක සියලු ධනය** වැඩිහිටි නිවාසයට පරිත්‍යාග කළහ.

(1) දායාදය (2) දහසකුත් එකක් (3) මුළු සේසත ම (4) පරක් තෙරක් නැති

* අංක 06 - 11 දක්වා ඇති වාක්‍යවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

(06) නිර්මාණකරුවෙකුට ශාස්ත්‍රීය දැනුම පමණක් නොව ........ අත්දැකීම් ද තිබීම අවශ්‍ය වේ.

(1) බුද්ධිමත් (2) විචල්‍යවත් (3) ප්‍රායෝගික (4) විචාරවත්

(07) එදින කාර්යාල ....... තුළ පෙර නොපැවැති සන්සුන් බවක් දිස් විය.

(1) පරිශ්‍රය (2) පරිග්‍රහණ (3) ප්‍රවේශය (4) පරිවහනය

(08) අතීත උරුමයන් රැක ගැනීමට පුරාවිද්‍යාඥයින් විසින් දරනු ලබන .......... අප සියලු දෙනා අගය කළ යුතු වේ.

(1) ප්‍රදානය (2) ප්‍රවාහය (3) ප්‍රගමනය (4) ප්‍රයත්නය

(09) ආචාර්යවරයා හමුවට පැමිණි ශිෂ්‍යයා ශීර්ෂ ප්‍රණාමයෙන් හා යුගත් ළමැදට එක් කිරීමෙන් එතුමාට ......... කළේ ය.

(1) අභිප්‍රේරණය (2) අභිවාදනය (3) අභිනන්දනය (4) අභියාචනය

(10) අකාරාදි පද පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති වරණය තෝරන්න.

(1) ඇතුගල්පුරය, විජිත පුරය, මාගම් පුරය, ගඟසිරි පුරය (2) දෙවිනුවර, තම්මැන්නා නුවර, යාපා පටුන, හඟුරන්කෙත
(3) මා තොට, සීතාවක, දඹදෙණිය, යාපහුව (4) අනුරාධපුරය, මාගම්පුරය, රයිගම් පුරය, විජිත පුරය

(11) "වටොරින් පුළුලුකුළින් දඟ යුවළින් පතු ලසිති
රැඟුමෙන් කළ කරණින් සොඳ අඟනන් දකු තොසිනි"
මෙහි දැක්වෙන අර්ධ අනුනාසිකාක්ෂර ගණන වනුයේ,
(1) දෙකකි. (2) තුනකි. (3) හතරකි. (4) පහකි.

* අංක 12, 13 ප්‍රශ්නවල අක්ෂර වින්‍යාසය නිවැරදි ලෙස යෙදී ඇති පිළිතුර තෝරන්න.

(12) (1) "පදමට වෙරළු මිණි කැට සුණු විසුළ හැඩ" (2) "හැම සඳ කෙළින සෙවනැලි ලිය මඩුළු වලා"
(3) "ළකල් මෙපුර තුර වළහා රිව් තැවුළ" (4) "හෙළන නඟන අත නුවණ'ග බැලුම් දිදී"

(13) (1) "මෙම ගීතයට සංගීතය සපයනු ලැබුවේ ශ්‍රී ලංකාවේ අති විශිෂ්ඨ ගාන්ධර්වයා වන ආචාර්ය පණ්ඩිත් අමරදේව ශූරීන් ය.
(2) "ශිල්ප ශාස්ත්‍රයෙහි අභ්‍යාස කැරැවීමටත්, ගැහැණු දරුවෙකු මෙන් ලජ්ජාශීලතාදියෙහි පිහිටුවීමටත් ....."
(3) කවියේ අර්ථයෙන් ප්‍රකාශ කරන හැඟීම් පද සංඝටනයෙන් නඟන හඬ වහල් කර ගැනීමෙන් උද්දීපනය කෙරේ.
(4) මේ ආදී වශයෙන් සළකන කල ඔහු කලා කෝෂ්ටාගාරයකි.

* අංක 14 - 15 ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර දී ඇති වරණ අතරින් තෝරන්න.

(14) රජ තේජසින් ....... වැනි ය යි රට වැසියෝ පවසති.
(1) නුබමිණ (2) හිරුමඩල (3) චක්‍රාවාට (4) මහ සයුර

(15) ඒ ආචාරින්ගේ..... හා සමාන වූ විශිෂ්ට රූ ඇති එක් දියණි කෙනෙක් ඇත්තාහ.
(1) පුරඟනක (2) නළඟනක (3) දෙවඟනක (4) කුලඟනක

(16) දී ඇති පද්‍ය අතුරෙන් නිපාත පදයක් යෙදී නැති පේළිය තෝරන්න.
(1) "සුනිල් දියේ සඳ කැලුම් වැදිලා" (2) "දකුණේ මෙන් ම උතුරෙන් හිරු නගියි උදේ"
(3) "විසිරී යන පරිදි රන් සමනොළුන් රොද" (4) "අනේ දෙව්දත් නුදුටි මොක්පුර"

(17) අර්ථයෙන් එකිනෙකට විරුද්ධ පද දෙකක් එකතු වී සෑදෙන යුගල පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.
(1) අය වැය, සුව දුක්, සිරිත් විරිත්, දිවා රෑ (2) එදා මෙදා, අඩු වැඩි, සරු නිසරු, අඟ මුල
(3) පව් පින්, ඇති නැති, ගොඩ මඩ, යන එන (4) උස් පහත්, වැර වෑයම්, හරි වැරදි, උගත් නූගත්

(18) ලසිත, දිසිත, ලලිත. හා විසිත යන පදවල අර්ථය පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) බබළන, ලෙළදෙන, විසිතුරු, දිස්වෙන (2) බබළන, දිස්වෙන, ලෙළදෙන, විසිතුරු
(3) ලෙළදෙන, බබළන, දිස්වෙන, විසිතුරු (4) විසිතුරු, ලෙළදෙන, දිස්වෙන , බබළන

(19) මුලින් දී ඇති පදයට විවිධාර්ථ දෙන පදයක් යෙදී නැති පිළිතුර තෝරන්න.
(1) මුව - අබියස, මුහුණ, මුවා, මුඛය (2) සර - නාදය, හෙළුම, හැසිරෙන, රිතලය
(3) වන - වැනුම, කැලය, වර්ණය, වීම (4) සත් - ශාස්ත්‍රය, රෝදය, ආයුධය, යහපත්

(20) <u>කු</u>ම - <u>කු</u>සට, <u>සූ</u>ප - <u>සු</u>මට යන පදවල ඉරි ඇඳි අක්ෂරයන්හි යෙදී ඇති පිල්ලම් පිළිවෙළින් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) දීර්ඝ පාපිල්ල, කෙටි ඇදපිල්ල, දීර්ඝ ඇද පිල්ල, කෙටි පාපිල්ල
(2) දීර්ඝ ඇදපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ පාපිල්ල, කෙටි ඇදපිල්ල
(3) දීර්ඝ ඇදපිල්ල, කෙටි ඇදපිල්ල, දීර්ඝ පාපිල්ල, කෙටි පාපිල්ල
(4) දීර්ඝ පාපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ ඇදපිල්ල, කෙටි ඇදපිල්ල

(21) පහත දැක්වෙන කව් පදවල ඉරි ඇඳි පද අයත් වන ක්‍රියා පද වර්ගය අනුපිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.
"කිසි දිනෙක පෙරළා <u>නො ආවොත්</u>"
"ගස්වැල් <u>කකා</u> පට පට ගා අලිරාල"
"බැලිය හැකි වී නම් <u>දැක</u> වැද <u>යා</u> කළණ"
(1) අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධික්‍රියා
(2) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා , විධික්‍රියා
(3) අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(4) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා

* අංක 22 හා 23 ප්‍රශ්නයන්හි එක් එක් වාක්‍යයෙන් ඉදිරිපත් කොට ඇති ව්‍යාකරණ විග්‍රහය අතුරෙන් වැරදි ව්‍යාකරණ විග්‍රහය දැක්වෙන වාක්‍යය තෝරන්න.

(22) (1) උත්සාහ ගනිතොත් විභාගයෙන් ඉහළ සාමාර්ථ්‍යයක් ලැබිය හැකි වේ. මෙහි ගනිතොත් යනු පූර්ව ක්‍රියා පදයකි.
(2) වෙළෙන්දී යන පදයේ බහු වචන අනුක්ත පදය වෙළෙන්දියන් යන්න ය.
(3) සාහිත්‍ය උත්සවය යන පද දෙක සන්ධිවීමෙන් සාහිත්‍යෝත්සවය යන පදය සෑදේ.
(4) අපේ ඓතිහාසික උරුමයන් අප ආරක්ෂා කරගත යුතු ය. යන වාක්‍යයේ ඓතිහාසික යනු තද්ධිත පදයකි.

(23) (1) වගුරට තරනිඳු - දඹදිව පරසිදු යන පද්‍ය පාදයේ සඳහන් පරසිදු යනු පතල යන්නට සමානාර්ථ පදයකි.
(2) නටත් අයෙක් සුරා මතින් යන්නෙහි අයෙක් යනු නිත්‍ය බහු වචන පදයකි.
(3) අවියත් දන අව්චාරවත් ලෙස කටයුතු කරති. මෙහි "අ" යනු උපසර්ගයකි.
(4) වෛද්‍යවරුන් විසින් රෝගීහු සුවපත් කෙරෙති යනු කර්ම කාරක වාක්‍යයකි.

(24) ප්‍රාසාදාංගණය, සමශීතෝෂ්ණ, නගරාංග හා යථෝක්ත යන පද අයත් වන සන්ධි විධිය තෝරන්න.
(1) පූර්ව ස්වර ලෝප සන්ධිය (2) පර ස්වර ලෝප සන්ධිය
(3) ස්වරාදේශ සන්ධිය (4) ගාත්‍රාදේශ සන්ධිය

(25) පූර්ව ස්වර ලෝප සන්ධි විධියට උදාහරණයක් නොවන පදය තෝරන්න.
(1) ආර්යාභරණ (2) සෙවණැති (3) දිව්‍යානුභාවයෙන් (4) උපනුපන්

(26) මුලින් දක්වා ඇති ව්‍යාකරණ විධියට අයත් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) අසම්භාව්‍ය ක්‍රියා - සිඳින, මඩින, කියන, තසින
(2) තද්ධිත පද - සිසිලස්, පැනිනි, විරෝධතා, ධෛර්යවන්ත
(3) කෘදන්ත පද - හැරඹූ, නටන, ලියුවෝ, බැඳීම්
(4) උපසර්ග පද - පිරිසිදු, සුවිශේෂ, අඳින, අනුබල

(27) පද බෙදීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පූර්ව ක්‍රියාව ද්විත්ව වූ විට තනි පදයක් සේ නොලියයි.
(2) පදයක මුලට යෙදෙන උපසර්ගයෙන් ප්‍රධාන පදය ඈත් කෙරෙයි.
(3) අවධාරණය සඳහා යොදන "ම" නිපාතය පෙර පදය හා එක්කර ලියයි.
(4) ව, වූ, විම, වී ආදි "ව" ධාතුවෙන් නිපන් පද වෙන් කර ලියයි.

(28) එක් එක් වරණයෙහි දී ඇති තේරුම් අතරින් වැරදි ලෙස අර්ථ ගැන්වූ වරණය තෝරන්න.
(1) කලවිට - කමත, අම්බරුවා - හරකා, ගොම්පස් - ගොම
(2) මුත්තෙට්ටුව - ගොයම් කපන අයට දෙන ආහාර, බැත - වී , අරක්වළ - කමත මැද තිබෙන ත්‍රිකෝණාකාර වූ කණුව
(3) මැඩුවන් - පෑගී ඉතිරි වන පිදුරු, යතුර - කුල්ල, කොළ මැඩීම - ගොයම් පෑගීම
(4) මුදුනා - කමතට ගොයම් ගොඩ ගෙන යන්නා, ඉපනැල්ල - ගොයම් ගොඩ, උප්පිඩ - සුබ මොහොත

(29) තත්සම වචන නිවැරදි ව තත්භවයට හරවා නැති පද ඇතුළත් පේළිය තෝරන්න.
(1) මිතු දහම, මිනිස් සිරුර, විදු සක්විති, ගැමි පෙදෙස
(2) සෙල් ලිපිය, දහස් වසර, මිග රජ, කතු වැකිය
(3) සරසවි ප්‍රවේශය, සිරිපා ලාංඡනය, වීණා වැයුම
(4) දෙටුපුත්, සොඳුරු දසුන, දෝ සතර, දුටු ගැමුණු

* අංක 30 සිට 33 දක්වා ප්‍රශ්නවල මුලින් දී ඇති වාක්‍යයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

(30) තණපත් අතර පිපි කුසුමින් මකරන්දය උරා ගෙන තණබිම් හරහා යන මද සුළඟේ පහස විඳිමට ඔබටත් හැකි වනු නො අනුමාන ය.
(1) තණපත් අතර පිපුණු මලින් බමරු රොන් උරා බොති.
(2) පිපුණු මලින් හමන සුවඳ උරා ගත් සුළඟේ පහස විඳිමට ඔබට ද හැකි වනු ඇත.
(3) තණ බිම් හරහා හමන මඳ සුළඟින් ගත සිත පින වේ.
(4) තණ බිම් අතර පිපුණු මල් මකරන්දයේ පහස විඳිමට හැකි වනු ඇත.

(31) " ගිම්හානයේ ගිලන් වී කෘශ ව සුදුමැලි ව
ඇදී ඇදී ඉකි ගසූ ගඟ නැවත පිරිපුන් ය"

(1) ඔය ඉකිබිඳිමින් ගලා බසින හඬ ඇසේ. (2) වියළි කාලයේ ඔයේ දිය අඩු වී ගොස් නැවත ඇදී යයි.
(3) ගිලන් ව කෘශ ව හා සියුමැලි ව තිබූ ගඟ ඉකි ගසයි. (4) වියළි කාලයේ ගඟේ දිය බෙහෙවින් අඩුවුවත් අද එය පිරී ඇත.

(32) භාෂා භාවිතයෙහි කිසියම් අංගයක් අසත්‍ය සේ සලකනු ලබන්නේ එම භාෂාව භාවිත කරන මිනිසුන්ට ආවේණික ආකල්ප හර පද්ධතිය හා දැක්මට අනුගතවයි.
(1) සමාජයේ ආකල්ප හා දෘෂ්ටිවලට පටහැනි වූ භාෂාවක් වෙතොත් එය අසත්‍යයකි.
(2) ඕනෑ ම භාෂාවක සත්‍ය අසත්‍ය බව තීරණය කළ යුත්තේ එම භාෂා සමාජයට ආවේණික භාෂා භාවිතය අනුවයි.
(3) මිනිසුන් අතර පොදුවේ අසත්‍ය යැයි සැලකෙන අංග භාෂාවෙහි තිබේ.
(4) භාෂාවේ යම් අංගයක් අසත්‍ය ද යන්න විසඳීමට ඉවහල් වන්නේ ඒ භාෂාවට අදාළ සමාජය අනුවයි.

(33) නූතන අවදියේදී ඇතැම් ජන සන්නිවේදන මාධ්‍යවල සහාය ලබමින් බිහිවන ජනප්‍රිය සංස්කෘතිය විසින් අපේ ස්ථිරසාර ශිෂ්ටාචාරය හා විශිෂ්ට සංස්කෘතිය වැනි දේශජ හිතකර ලක්ෂණ යටපත් කරලීමට උත්සාහ ගනී.
(1) ජනප්‍රිය සන්නිවේදන මාධ්‍ය අපේ සංස්කෘතිය හා ශිෂ්ටාචාරය යටපත් කරයි.
(2) ස්ථිරසාර ශිෂ්ටාචාරය හා විශිෂ්ට සංස්කෘතිය අපේ දේශජ හිතකර ලක්ෂණ විනාශ කරයි.
(3) ඇතැම් සන්නිවේදන මාධ්‍ය විසින් අපේ ශිෂ්ටාචාරය හා සංස්කෘතිය විනාශ කිරීමට උත්සාහ ගනී.
(4) වර්තමානයේ ජන සන්නිවේදන මාධ්‍ය තුළින් සංස්කෘතියේ දේශජ ලක්ෂණ පෙන්වයි.

(34) පහත දැක්වෙන වාක්‍යවල ඇතුළත් ප්‍රකාශ අතරින් නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.
(1) පවතින ලෝක ස්වභාවය ඉක්මවා වර්ණනා කිරීම අතිශයෝක්තිය වේ.
(2) ඡන්දස යනු ගුරු ලුහු මාත්‍රා නියමය වේ.
(3) අකුරක් හෝ ශබ්දයක් හෝ පදයක් හෝ පුන පුනා යෙදීම එළි සමය වේ.
(4) උපමාව හා උපමේය යන දෙක ම එකක් ලෙස සැලකීම රූපකය වේ.

* අංක 35 සිට 39 දක්වා ඇති වාක්‍යවලින් ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

(35) (1) නාහිමි විහාරයට වැඩම කළහ. (2) රටට දැයට හිතකාමී පුරවැසියෝ බිහි වෙත්වා.
(3) පයින් යන්නන් දකුණු පයින් යා යුත්තේ ය. (4) කාරක සභාව සිය යෝජනා ඉවත් කර ගත්තෙහි ය.

(36) (1) මැණියන් දරුවන් රැකබලා ගනිති. (2) තෙරුන් වහන්සේ වස් විසීම පිණස ආරණ්‍යයට වැඩි සේක.
(3) ගුරුතුමිය ළමයි සමග ප්‍රදර්ශනය නැරඹුවා ය. (4) ළමා පෙළ මහත් උද්යෝගයෙන් ක්‍රීඩා තරගය නරඹන ලදී.

(37) (1) විනිසුරුවෝ තරඟ ප්‍රතිඵල දන්වාවී.
(2) ගුරුවරු රැස්වීමට පැමිණ ඇත.
(3) කම්කරුවෝ බොහෝ දෙනෙක් ශ්‍රමදානයට සහාය දැක්විය.
(4) ආලෝක පූජාවෙන් මුළු පරිසරය ම ඒකාලෝක විය.

(38) (1) ධීර නිවාසයේ ක්‍රීඩකයෝ ජයග්‍රහණය කරතැ'යි අපි සිතුවෙමු.
(2) ගුරුවරුන් ආදර්ශ සපයත් ද දරුවන් ඒ මග යනු ඇත.
(3) දක්ෂ කථිකයෙකු වූ අදිකාරම්තුමා අවිහිංසාවාදියෙක් ද විය.
(4) ගංවතුරෙන් ගෙවල් දොරවල් රාශියක් විනාශ වූහ.

(39) (1) වෙළෙන්දන් විසින් පාරිභෝජනයට නුසුදුසු ආහාර විකුණති.
(2) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් දරුවෝ යහමඟ යැවෙති.
(3) විදුහල්පතිතුමා විසින් ප්‍රදර්ශනය විවෘත කරයි.
(4) සංවිධායකයින් විසින් නිතරඟයෙන් මා තෝරා ගත්තේ ය.

(40) "තරක දෙයක වුවත් යම් හොඳකුත් ඇත." යන කියමනට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.
(1) පතට ඉපදී මහාවට නාඬන් (2) තෙම්ච්ච කුකුළාට සීතල නැහැලු
(3) යමයාගේ නඩු තීන්දුව වාගෙයි. (4) කොහොඹ ගහේ හෙවණ නම් සීතලයි.

47157

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

**10 - ශ්‍රේණිය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - II**

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 02යි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

---

- අංක i සිට x දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) පහත දැක්වෙන වාක්‍ය කර්මකාරයට හරවා ලියන්න.
(අ) කම්කරුවෝ මහමං තැනූහ.
(ආ) ගුරුවරු දරුවන්ට අවවාද කරති.

(ii) පහත දැක්වෙන වාක්‍යයෙන් උපුටා අ, ආ යටතේ දක්වා ඇති වචන පොදු ව්‍යවහාරයෙන් ලියන්න.
ගොබ්බක් ගිල්ලා වගේ ඔය හේලංකඩේ දපා තියන්නෙ නැතුව මේං මෙහෙ වරෙන් නඟා
(අ) ගොබ්බක් ගිල්ලා -
(ආ) හේලංකඩේ -

(iii) යමක් දන්නා / යම් කාර්යයක නියුතු / යම් තැනෙක වසන බව හැඟවීමට 'ඉ' තද්ධිත ප්‍රත්‍යය යෙදේ.
(අ) ස්වල්පබව / කුඩාබව හැඟවීමට යෙදෙන තද්ධිත ප්‍රත්‍යය කුමක් ද?
(ආ) 'නීති' යන පදයට 'ඉක' යන ප්‍රත්‍යය එකතු වීමෙන් සෑදෙන තද්ධිත පදය ලියන්න.

(iv) පහත යෙදුම්වලට තනි පද ලියන්න.
(අ) පූජා ආදියට යැවීමට සූදානම් කළ ආහාර
(ආ) ආත්මීය වශයෙන් බැඳුණා වූ

(v) මතු දැක්වෙන ප්‍රස්තාව පිරුළුවල අදහස ලියන්න.
(අ) වැයම් මිසක නැයන් මොටද කලියුගේ
(ආ) නමින් කොස්වත්තේ කන්ට පොලොසුත් නැත්තේ.

(vi) (අ) 'ජංඝා යුග්මය' යන්නෙහි තත්භව පදය ලියන්න.
(ආ) 'සඳ බිඹු' යන්නෙහි තත්සම පදය ලියන්න.

(vii) පහත දැක්වෙන වචනවල සන්ධි නාමය ලියන්න.
(අ) ස්වේච්ඡා (ආ) ඔරලෝසුවෙන්

(viii) පහත දක්වා ඇති පද්‍ය පාදයන්හි තද කළු අකුරින් දක්වා ඇති වචනවල ක්‍රියා වර්ගය ලියන්න.
(අ) සඳේ **මුදුන්පත** අස්විද නැකත සිට
(ආ) **බල** සුබ නිමිති පෙර මග නැකතටත් වැඩී

(ix) පහත දැක්වෙන වාක්‍ය ආඛ්‍යාත අධ්‍යාහාරයෙන් ලියන්න.
(අ) වෛද්‍යවරු අද වර්ජනයේ යෙදෙති.
පහත දැක්වෙන වාක්‍ය ගෞරවාර්ථ බහුවචනයට හරවා ලියන්න.
(ආ) පියා දරුවන් රකියි.

(x) පහත කවි දෙපාදයෙහි 'රඟ' යන පදය අර්ථ දෙකක යෙදී ඇත. අ, ආ යටතේ එකී අර්ථ දෙක ලියා දක්වන්න.

රඟ අඟවා සුරඟන රඟ බේදය
සෙද කරවා රජ සබය පබෝදය

(2×10 - 20)

(02) පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. පහත දැක්වෙන එක් එක් විස්තරයට මුලින් වරහන් තුළ ඇති අකුර ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද ලියන්න.

- අන්තර්ගත විය යුතු කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළගැස්විය හැකි ක්‍රියා පිළිවෙළ
- යොදා ගත හැකි මාතෘකාව

ආදිය පිළිබඳ ව මග පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න.

(අ) භාෂා සාහිත්‍යය සෞන්දර්ය මිනිස් සිත මෘදු කරන දිව ඔසුවක් වැන්න. එහෙත් නූතන කලබලකාරී සමාජ රටාවත් සමඟ නූතන පරපුර එකී වින්දනාත්මක පක්ෂයෙන් ක්‍රමයෙන් ඈත් වෙමින් සිටිති. එය ප්‍රචණ්ඩකාරී සමාජ වටපිටාවක් නිර්මාණය වීමට ද මග පාදයි. ඒ සඳහා පිළියම් යෙදීම අද අද ම කළ යුතු ව ඇත.

(ආ) අපේ සාම්ප්‍රදායික ආහාර රටාව අද ඉතා වේගයෙන් වෙනස් වෙමින් පවතී. කොස්, දෙල්, අල, බතල, උඳු, මුං, කව්පි, කුරහන් වැනි ශක්තිජනක දේශීය ආහාර පසෙක ලා අද අපි ඇස, දිව පිනවන ක්ෂණික පහසු ආහාරවලට නැඹුරු වෙමින් සිටිමු. රටක් වශයෙන් ගත් කල මෙහි අනාගත ප්‍රතිඵල එතරම් හිතකර විය නොහැකි ය.

(ඉ) ජන මාධ්‍යයෙහි වගකීම වන්නේ එක් පරපුරක සංස්කෘතිකමය වටිනාකම් ඊළඟ පරපුරට පවරා දීමයි. එහෙත් අද අපේ ජනමාධ්‍ය එකී වගකීම හඳුනාගෙන තිබේ ද? අයාලේ යන මෙම මාධ්‍ය සදාචාරය අද අපේ සංස්කෘතිකමය වටිනාකම් ගැන සලකන බවක් නොපෙනේ. මෙහි අනාගත ඵලය කෙබඳු විය හැකි ද?

(ඊ) රටක මාර්ග පද්ධතිය එරට සංවර්ධනයේ ජය මාවතයි. මාර්ග දියුණුවත් සමඟ රටක ආර්ථිකය මෙන් ම සමාජ ජීවිතය ද පිබිදී එයි. අනෙක් අතට එය රටේ සංවර්ධනය වෙනුවෙන් කරන දිගුකාලීන ආයෝජනයක් ද වෙයි. මෙම පිබිදීම අනාගත ශ්‍රී ලංකාවේ ආශ්චර්යය විය නොහැකි ද? (ලකුණු 25)

(03) පහත දැක්වෙන පාඨය වචන 40 - 45 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශයේ අග ලියන්න.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වූ විකාශනයේ තවත් වැදගත් අවස්ථාවක් දක්නට ලැබෙන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ අධ්‍යාපනය තුළිනි. ඇමරිකානුකරණය වීම සඳහා ඇමරිකානු විප්ලව සමයේ අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් ජෝන් ඇඩම්ස්, ජේර්ජ් වොෂින්ටන්, ජෝන් ඩෙව් යන අය විශාල මෙහෙවරක් කර ඇත. සාමාන්‍ය ජනතාවට අධ්‍යාපනයේ සම අවස්ථා උදාකර දීමට නැඹුරු වී නව ආකල්ප මත අධ්‍යාපනය ගොඩ නගන්නට චින්තනය යොමු වූයේ ප්‍රධාන පරමාර්ථ කීපයක් ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙනි. ප්‍රජාතන්ත්‍රවාදී ආකල්ප ප්‍රචලිත කරමින් සමගි සම්පන්න ඇමරිකානු ජාතියක් ගොඩ නැගීම එක් අපේක්ෂාවකි. හැකියාව අනුව අධ්‍යාපනය ලැබීමට අවකාශ සැලැස්වීම දෙවන අපේක්ෂාව විය. තුන්වන අපේක්ෂාව වූයේ සියලු ම දරුවන්ට අධ්‍යාපනයේ සම අවස්ථා උදාකර දීමයි. සතරවනු ව දේශපාලන ක්ෂේත්‍රයේ බුද්ධිමත් ලෙස කටයුතු කළ හැකි තීරණ ගත හැකි ඇමරිකානු ජාතියක් බිහි කිරීමට අපේක්ෂා කරන ලදී. මෙය අධ්‍යාපන විකාශයේ වැදගත් නැඹුරුවක් ලෙස සැලකිය හැකි ය.

(ලකුණු 10)

(04) පහත දැක්වෙන පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

වැහි වලාකුළ පෑ කළු යැයි ඔබේ
නොහොබිති'යි කිසි ලෙස නොසතොස් නොවන්
සිරුරු පෑයෙනු ගත් සුදනෝ ලොවේ
නොහඳුනත් උතුමන් ගුණයෙන් විනා

නද අසා ඔබගේ පැහැයත් බලා
මොනරු පිල් විදහා රඟ දෙත් නදින්
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්
තුරු ලියත් ලියලයි සැනසී දියෙන්

සුදු වලාකුළු බෝමැ අහස් කුසේ
ඉහළ යෙයි ඔබ යාමැ පහත්වමැයි
ඒ පුදුමෙක් ද උසස් නැණවත් දනෝ
ගුණ බරින් නැමුණෙව් පවතිත් නිතින්

ගුණ බලා ඔබගේ ලොසබා දහම්
ඔබ, රැ අන් කිසිවෙක් නිසි නෑ කියා
විදුලියත් පැහැපත් රන් දම් සෙයින්
පලඳවන්නේ ඔබේ ගෙලමැ'යි බලන්

(i) කවියා පවසන පරිදි වැහි වලාකුළ අසන්තෝෂ නොවිය යුත්තේ කුමක් ගැන ද?
(ii) මොනරු පිල් විදහා නටන්නේ මන් ද?
(iii) උසස් නැණවත් ජනයා මෙහි උපමා කොට ඇත්තේ කුමකට ද?
(iv) ගස්වැල් ප්‍රාණවත් ව දලුලන්නේ කවර හේතුවක් නිසා ද?
(v) සොබාදහම වැහි වලාකුළට දක්වන උපහාරය ලෙස කවියා මෙහි දක්වා ඇත්තේ කුමක් ද? (ලකුණු 10)

(05) උඩුබද්දාව ජයසුමන මහ විදුහලේ නව පුස්තකාලය විවෘත කිරීම 2013-05-24 වැනි දින උඩුබද්දාව ප්‍රදේශීය ලේකම්තුමා අතින් සිදුවිය. ඊට සමගාමී ව පොත් සල්පිලක් ද, ළමා නිර්මාණ ප්‍රදර්ශනයක් ද විදුහලේ ප්‍රධාන ශාලාවේ දී පවත්වන ලදී. එදින උදෑසන පැවති උත්සව සභාවට සහභාගි වූ ප්‍රදේශයේ ප්‍රවීණ කලාකරුවකු වන ඩබ්ලිව්. පී. මහානාම මහතා පොත්පත් කියවීමේ අගය පිළිබඳ ව හරබර දෙසුමක් කළේ ය. සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලියේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට සහතික පත්‍ර ප්‍රදානය කිරීම ද එදින සිදුවිය.

ඉහත කරුණු පදනම් කොට ගෙන උඩුබද්දාව ප්‍රාදේශීය වාර්තාකරු විසින් ලියන ලද පුවත්පත් වාර්තාව ලියා දක්වන්න. (වචන 100 පමණ සෑහේ.)

නැතහොත්

පහත සඳහන් වන්නේ 2013-03-19 වැනි දින පුවත්පතක පළ වූ දැන්වීමකි. එහි දැක්වෙන රැකියාව සඳහා ඉල්ලුම් කිරීමට සුදුසු අයදුම්පත සකස් කොට සම්පූර්ණ කරන්න.

<u>ඔබටත් රැකියාවක්</u>

කොළඹ 10, වීරවර්ධන සහ පුත්‍රයෝ පොත් සමාගමේ අලෙවි ප්‍රවර්ධන කළමනාකාර තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම් :

- අ.පො.ස. (උ.පෙ) වාණිජ හා ගිණුම්කරණය විෂයට සම්මාන සාමාර්ථ්‍යයක් සහිත ව විෂයයන් තුන ම සමත් ව සිටිය යුතු ය.
- අ.පො.ස. (සා.පෙ) ගණිතය, ඉංග්‍රීසි, සිංහල ඇතුළු විෂයයන් 6ක් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් ව අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය හතරක්වත් ලබා තිබිය යුතු ය.
- වෘත්තීය සුදුසුකම් :
  - අලෙවි ප්‍රවර්ධන කටයුතු පිළිබඳ වසරක පළපුරුද්ද
  - පරිගණක භාවිතයෙන් කටයුතු කිරීමේ හැකියාව
  - සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා හැකියාව විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.
- වයස අවුරුදු 21 - 30 අතර විය යුතු ය.

ඔබේ අයදුම්පත 2013-06-28 වන දිනට පෙර පහත දැක්වෙන ලිපිනයට අප වෙත යොමු කරන්න.

පිරිස් කළමනාකරු
වීරවර්ධන සහ පුත්‍රයෝ
අංක. 168,
මරදාන පාර,
කොළඹ 10.

(ලකුණු 15)